# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර සඳහා බඳවා ගැනීම (බාහිර )

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත සඳහන් තනතුරු පුරප්පාඩුව ස්ථිර පදනම මත පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**(1) රැකියා විස්තරය**

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) සමස්ත මූල්‍ය කළමනාකරණය භාරව කටයුතු කිරීම.
2. මූල්‍ය සැලසුම්කරණය සිදු කිරීම සහ මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම.
3. මූල්‍ය පාලනයට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගී වීම.
4. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) කළමනාකාරිත්වයට මූල්‍ය හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් උපදේශන සහ මාර්ගෝපදේශ ලබා දීම.
5. ආයතනයේ මූල්‍ය සහ සම්පත් සැලසුම්කරණ කටයුතු සිදු කිරීම.

**(2) අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

ගිණුම්කරණය, මූල්‍ය හෝ මූල්‍ය ආර්ථික විද්‍යාව ක්ෂේත්‍රයේ 1 වන හෝ 2 වන පන්තියේ ගෞරව උපාධිය සහ පශ්චාත් උපාධිය සමඟ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 20 ක සතුටුදායක සේවා පළපුරුද්ද සහ එයින් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම .

හෝ

ගිණුම්කරණය, මූල්‍ය හෝ මූල්‍ය ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ 1 වන හෝ 2 වන පන්තියේ ගෞරව උපාධිය සහ එම ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය සමඟ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 20 ක සතුටුදායක සේවා පළපුරුද්ද සහ එයින් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම .

හෝ

ගිණුම්කරණය, මූල්‍ය හෝ මූල්‍ය ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය සහ පශ්චාත් උපාධිය සහිත දිප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

හෝ

ගිණුම්කරණය, මූල්‍ය හෝ මූල්‍ය ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය සහ එම ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය සහිත දිප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

**(3) බඳවා ගැනීමේ පටිපාටිය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කෙරේ.

**(4) වැටුප් පරිමාණය :-** TRC 1.3 -රු. 262,752 (10x11,261) -(10x12,669) – 502,052

( මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට බලපැවැත්වේ) .

**(5) වයස :** අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 24 - 55 අතර විය යුතුය.

**(6) අයදුම් කිරීමේ ක්‍රමය :**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk වෙතින් බාගත කරගත හැකිය..
2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. **සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව 2026.08.05 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුරට බඳවා ගැනීම (බාහිර) යනුවෙන් සඳහන් කළ යුතුය.**
6. අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lkවිද්‍යුත් තැපෑලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව " අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුරට බඳවා ගැනීම (බාහිර) " විය යුතුය.
7. රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
8. **අයදුම්පත් 2026.08.05 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.**

**(7) පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා සෘජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක 276
ඇල්විටිගල මාවත
කොළඹ 08